# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 47 දරන
# ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූලි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

**1967 අංක 14 දරන ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 47 දරන ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** 1967 අංක 14 දරන ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ 8 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1967 අංක 14 දරන ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ) පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (3) ශ්‍රී ලංකා පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා මේ පනත යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ සුදුස්සක් කිරීමේ දී 1964 ඔක්තෝබර් මස 30 වන දිනයට පසු ඒ තත්ත්වය ප්‍රදානය කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාව සහ ඉන්දියාවේ පුරවැසියන් වූ හෝ එලෙස පිළිගනු ලැබූ තැනැත්තන්ගේ සංඛ්‍යාව අතර අනුපාතය හැකිතාක් දුරට සියලු අවස්ථාවල දී 4 : 7 ක් වන බවට අමාත්‍යවරයා වග බලාගත යුතු ය. ඒ අනුපාතය ආගණනය කිරීමේ දී—

(අ) 1964 ඔක්තෝබර් මස 30 වන දිනට පසු උත්පත්තිය ලැබ, ඒ තත්ත්වය ප්‍රදානය කරනු ලැබූ හෝ එලෙස පිළිගනු ලැබූ තැනැත්තන් ; සහ

(ආ) ඉන්දු-ලංකා ගිවිසුම අදාළ නොවන තැනැත්තන්

ගණන් ගනු නොලැබිය යුතු ය. ".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.